**ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා**
**උපාධිධාරීන් හා උසස් ජාතික ගණකාධිකරණ/වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමේ තරග විභාගය - 2018**

ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පහත සඳහන් විෂයන්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් හා උසස් ජාතික ගණකාධිකරණ/වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.11.30 දින වේ. තරග විභාගය 2019 මාර්තු මාසයේදී පවත්වනු ලැබේ.

උපලේඛන අංක 01 - පුරප්පාඩු විෂය ලේඛනය

| අ.අ | විෂය | විෂය කේත අංකය |
|---|---|---|
| **01- 11 ශ්‍රේණිය දක්වා පුරප්පාඩු විෂයන්** | | |
| 1 | ප්‍රාථමික | 1 |
| 2 | සිංහල | 2 |
| 3 | ව්‍යාපාර හා ගිණුම්කරණය | 3 |
| 4 | චිත්‍ර | 4 |
| 5 | නැටුම් | 5 |
| 6 | සංගීතය (පෙරදිග) | 6 |
| 7 | කෘෂි හා ආහාර තාක්ෂණය | 7 |
| 8 | ගණිතය | 8 |
| 9 | විද්‍යාව | 9 |
| 10 | භූගෝල විද්‍යාව | 10 |
| 11 | ඉතිහාසය | 11 |
| 12 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 12 |
| 13 | ශාරීරික අධ්‍යාපනය | 13 |
| **අ.පො.ස. (උ/පෙළ ) විෂයන්** | | |
| 1 | රසායන විද්‍යාව | 15 |
| 2 | භෞතික විද්‍යාව | 16 |
| 3 | ජීව විද්‍යාව | 17 |
| 4 | ව්‍යාපාර අධ්‍යනය | 18 |
| 5 | ආර්ථික විද්‍යාව | 19 |
| 6 | ගිණුම්කරණය | 20 |
| 7 | නාට්‍ය හා රංගකලාව | 21 |
| 8 | දේශපාලන විද්‍යාව | 22 |

01. **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

(අ) අයදුම්කරු /අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(ඇ) 2018.11.30 දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඌව පළාත තුළ තිබිය යුතුය. (ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරනු ලබන පදිංචිය පිළිබඳ ග්‍රාම සේවා සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.)

ඌව පළාත් සභා සීමාව තුළ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වසර 03 ක් හෝ ඊට වැඩි ස්ථිර පදිංචියක් ඇති අයකු සමග නිත්‍යානුකූලව විවාහ වී ඌව පළාතේ පදිංචියට පැමිණ අයදුම්පත් කැඳවන අවසාන දිනට ඡන්ද හිමි නාමලේඛනයෙන් ලියාපදිංචිය සනාථ කරන කෙනකුට ද අයදුම් කළ හැක. එවැනි අය ලිඛිත සාක්ෂි මගින් මෙම තත්ත්වය තහවුරු කිරීම අනිවාර්ය වේ.

(ඈ) 2018.11.30 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.11.30 දින හෝ ඊට පෙර හා 1983.11.30 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

02. **අධ්‍යාපන සුදුසුකම් :-**

2.1 2.1.1 අ.පො.ස. (සා/පෙළ) විභාගයේදි සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වීම.

2.1.2 අ.පො.ස. (උ/පෙළ) නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වීම හෝ

අ.පො.ස. (උ/පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සහිතව (අවම වශයෙන් විෂයන් 03 කින් ) එකවර සමත් විය යුතුය.

සටහන - විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස (උ/පෙළ ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ටද අයදුම් කළ හැක.

2.2 ඉහත 2.1 හි සුදුසුකම් සමග එක් එක් විෂයට අදාළව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

2.2.1 **01 - 11 වසර විෂයන්ට අදාළ සුදුසුකම් :**

| අ.අ | විෂය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| **1** | **ප්‍රාථමික** | විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් පිරිනමනු ලබන සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| **2** | **සිංහල, භූගෝල විද්‍යාව, ඉතිහාසය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමෙන ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාළව විශේෂ උපාධියක් ලබා තිබීම. |
| **3** | **චිත්‍ර, නැටුම්, සංගීතය (පෙරදිග)** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබා ගත් ප්‍රසාංගික කලා / ලලිත කලා හෝ දෘශ්‍ය කලා උපාධියක්<br>හෝ<br>අයදුම්කරනු ලබන විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරා උපාධියක් ලබා තිබීම<br>සහ<br>අ.පො.ස. (උ/පෙළ ) සඳහා අදාළ විෂය හදාරා සමත්ව තිබීම.<br>** සටහන බලන්න. |
| **4** | **කෘෂි හා ආහාර තාක්ෂණය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් කෘෂි විද්‍යාවේදී විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම |
| **5** | **ගණිතය, විද්‍යාව** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් භෞතීය විද්‍යා / ජෛවීය විද්‍යා විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| **6** | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් තොරුතුරු හා **සන්නිවේදන** තාක්ෂණය / පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම |
| **7** | **ව්‍යාපාර හා ගිණුම්කරණය,** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමෙන ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාළව විශේෂ උපාධියක් ලබා තිබීම හෝ උසස් තාක්ෂණ ආයතනයෙන් පිරිනමන සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ /වාණිජ ඩිප්ලෝමාව ලබා තිබීම. |
| **8** | **ශාරීරික අධ්‍යාපනය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් පිරිනමන ශාරීරික අධ්‍යාපනය/ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය විෂයට අදාළ උපාධියක් ලබා තිබීම |

** සටහන : ප්‍රසාංගික කලා / ලලිත කලා හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිධාරීන් තරග විභාගයේ එක් එක් විෂයට අදාළ සාධනීය මට්ටම (40 %) ලබා ගෙන ඇත්නම් එම අයට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, එම උපාධිධාරීන්ගෙන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු ඉතිරිව පවතින්නේ නම් පමණක් තරග විභාගයේ එක් එක් විෂයට අදාළ සාධනීය මට්ටම (40%) ලබා ගෙන ඇති අනෙකුත් උපාධිධාරීන් කුසලතාවයේ අනුපිළිවෙලින් පුරප්පාඩු සම්පූර්ණ වන තෙක් සලකා බලනු ලැබේ.

2.2.2. **අ.පො.ස. (උ/පෙළ ) විෂයන්ට අදාළ සුදුසුකම් :**

| අ.අ | විෂය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| **1** | **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව,** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාළව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| **2** | **ආර්ථික විද්‍යාව, නාට්‍ය හා රංගකලාව, දේශපාලන විද්‍යාව** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාළව විශේෂ උපාධියක් ලබා තිබීම. |
| **3** | **ව්‍යාපාර අධ්‍යයනය, ගිණුම්කරණය** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් අයදුම්කරනු ලබන විෂයට අදාළව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ සිව් අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ/වාණිජ ඩිප්ලෝමාව ලබා තිබීම. |

2.3 **එක් එක් විෂයට අදාළව ඉහත 2.1 හා 2.2 හි දක්වා ඇති සුදුසුකම් 2018.11.30 දිනට හෝ ඊට පෙර වලංගු පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.**

03. **සේවා කොන්දේසි :-**

(අ) මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

(ආ) මුලින් පත් කරන පාසලේ වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුයුක්ත කිරීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ඇ) වසර 05 ක සේවා කාලයකට පසු ඌව පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ වෙනත් පාසලකට ස්ථාන මාරුවීම් ලබා දීමට ඌව පළාත් සහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සලකා බලනු ඇත.

(ඈ) රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

(ඉ) උපාධිධාරීන් ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I (අ) ශ්‍රේණියටද, ඩිප්ලෝමාධාරීන් ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I (ඇ) ශ්‍රේණියටද බඳවා ගනු ලැබේ.

(ඊ) 2016.02.25 දිනැති රා.ප.ව. අංක **03/2016 හි GE-1-2016 වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු.27,740/- 300x6-380x7- 445 x2-33,090/- මාසික** වැටුප් පරිමාණය අනුව උපාධිධාරීන් 14 වන වැටුප් පියවර වන රු.32,200/- ක මාසික වැටුප් පියවරෙහිද ඩිප්ලෝමාධාරීන් 7 වන වැටුප් පියවර වන රු.29,540/- මාසික වැටුප් පියවරෙහිද පිහිටුවනු ලබන අතර, එම චක්‍රලේඛයේ උපලේඛන අංක II අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

4.1 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.2 සහ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව පාසල් පාදක ක්‍රමය අනුව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

4.2 විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයට හා ඉගැන්වීමේ හැකියාව මැන බැලීම සඳහා පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ලිඛිත තරග විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.3 පුරප්පාඩු ප්‍රමාණයෙන් 3% ක ප්‍රමාණයක් රා.ප.ව. 27/88 හා විධි විධාන අනුව ආබාධිත පුද්ගලයින් සඳහා වෙන් කරනු ලැබේ.

4.4 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.5 **ප්‍රායෝගික පරීක්ෂණය** :

ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලේ. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් නිර්ණායක පදනම් කොට ගෙන මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

4.6 එමෙන්ම මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

05. **අයදුම් කළ යුතු පිළිවෙල :-**

5.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පතේ ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 06 දක්වා කොටස් පළමු පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද ඇතුළත් වන සේ අයදුම්පත සැකසිය යුතුය.

5.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.11.30 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ " ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ඌව පළාත් සභාවේ සිංහල මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් හා උසස් ජාතික ගණකාධිකරණ/වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමේ තරග විභාගය - 2018" යනුවෙන් සහ ඔබ අයදුම් කරන විෂය හා විෂය අංකය පැහැදිලිව සටහන් කළ යුතුය.

5.3 දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියතු අයදුම්කරුවන් අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

5.4 අයදුම්කරුවකුට එක් විෂයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම්කරනු ලබන විෂය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. උපලේඛන අංක 01 අනුව අයදුම්කරනු ලබන විෂය හා විෂය කේත අංකය, අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.5 එක් අපේක්ෂකයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පතෙහි තම මනාපයේ අනුව https://www.up.gov.lk/notices/vacancies/ වෙබ් අඩවියෙහි හි සඳහන් පුරප්පාඩු පාසල් අතරින් ඉල්ලුම් කරන විෂයට අදාළව පුරප්පාඩු පවතින පාසල් 3ක් හා පාසලට අදාළ අනුක්‍රමික අංකය අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පතද https://www.up.gov.lk/notices/vacancies/ වෙබ් අඩවියෙන් භාගත කර ගත හැක. ඉල්ලුම් කරන පාසල් හා එහි අනුපිළිවෙල පසුව වෙනස් කරනු නොලැබේ. සේවා අවශ්‍යතාවය මත ඉල්ලුම් කරන ලද පාසලකට හැර වෙනත් පාසලකට පත්කළ හැකි අතර, පාසල් නම් කිරීම ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකරනු ලැබේ.

5.6 නියමිත ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු ගෙවා නොමැති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර පුවත්පත් නිවේදනයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීමකි. අයදුම්පත තැපෑලේදි නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.7 **අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු/ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06. **විභාග හා පරිපාලන ගාස්තු :**

විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.600/- කි. මෙම මුදල *<u>ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත</u>* මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, එම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

07. විභාග පටිපාටිය සහ තරග විභාගයේ විෂය නිර්දේශය :-

**7**.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත / අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 තරග විභාගය බදුල්ල සහ මොණරාගල නගරවලදී පැවැත්වෙනු ඇත. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් බදුල්ල නගරයේදි පමණක් විභාගය පැවැත්වෙනු ඇත.

7.3 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

7.4 විභාග දිනයේදි අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

7.5 තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පතක් නිකුත් කිරිම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදි අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

7.6 මෙම තරග විභාගය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.7 ලිඛිත තරග විභාගය බහුවරණ හා කෙටි පිළිතුරුවලින් සමන්විත පහත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02 ) සඳහාම පෙනී සිටිය යුතුය.

**01 අභියෝග්‍යතාව - කාලය පැය 01 - ලකුණු 100**

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.

**02. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100**

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා /හෝ දේශීය වශයෙන් සිදු වී ඇති සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරග විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත යුතුය.

7.8 ප්‍රායෝගික පරීක්ෂණය : **කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ - උපරිම ලකුණු 25**

අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ. මෙම පරීක්ෂණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | නිර්ණායකයන්හි අරමුණ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ය වීම | සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතුවීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම. | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් /ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම. | 05 | 02 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | | 25 | 10 |

- ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

08. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදි සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

09. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාර ගනු නොලැබේ.

10. **සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදි ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම /නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

12. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

(ගාමිණී මහින්දපාල ජෝපියස්)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2018.10. 29 වන දින.
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
බදුල්ල.